# Path to Success – Study Pack

# සිංහල සාහිත්‍යය සංග්‍රහය

## 10 ශ්‍රේණිය

### තෙවන පාසැල් වාරය සඳහා ඉගෙනුම් අත්වැල




අධ්‍යාපන සංවර්ධන අංශය

කලාප අධ්‍යාපන කාර්යාලය

කැලණිය

## උපදේශනය හා අධීක්ෂණය

පී.ඩී. ඉරෝෂිණී පරණගම මිය
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

## මෙහෙයවීම හා සංවිධානය

එෆ්. එච්. ජේ. පී. සිල්වා මයා
නියෝජ්‍ය කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන සංවර්ධන)

## විෂය සම්බන්ධීකරණය

වයි. ආර්. වයි. ඩී. එල්ලාවල මිය
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල)

## සම්පත් දායකත්වය

මහේන්ද්‍ර මද්දේගම මයා - ගුරු (කොහල්විල චන්ද්‍රරතන මහා විද්‍යාලය)

**සියලුම හිමිකම් ඇවිරිණි.**

# මුනි සිරිපා සිඹිමින්නේ

කොළඹ යුගයේ වැඩිහිටි පරපුරේ කවියකු වන මහින්ද හිමි ඉංග්‍රීසි අධිරාජ්‍යවාදයට එරෙහිව සිංහල ජාතික ස්වාධීනත්වය හා ස්වතන්ත්‍රතාව උදෙසා කවි යොදාගත් ජනහිතකාමියෙකි. දොලොස් හැවිරිදි වියේ දී ශ්‍රී ලංකාවට පැමිණි එහිමි සිය ජීවිත කාලය ම තියුණු ජාතිහිතෛෂියෙකු හා දේශමාමකයකු ලෙස දෙස, බස හා රැස නගා සිටුවනු සඳහා කරන ලද මෙහෙය අනල්ප ය. මරදානේ මහා බෝධි විද්‍යාලයෙන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලද එහිමි ප්‍රාචීන භාෂා හා බුද්ධ ධර්මය හැදෑරුයේ විද්‍යෝදය පිරිවෙන, දොඩම්දූවේ ශෛල බිම්බාරාමය හා රත්මලානේ පුරාණ රජමහවිහාරය යන විද්‍යායතන වලිනි.

මහින්ද හිමි විසින් රචනා කරන ලද කාව්‍ය නිර්මාණ මූලික වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය.

- ළමයින් උදෙසා ලියූ කවි
- දේශානුරාග හා ජාතිකාභිමාන කවි
- බුද්ධාභිවන්දනා කවි

පානදුරේ මහ බෙල්ලන ශ්‍රී සුධර්මාරාමයේ වැඩ වෙසෙමින් ආනන්ද මහා විද්‍යාලයේ ගුරුවරයකු ලෙස සේවය කළ මුල් කාලයේ දී වැඩි වශයෙන් ළමයින් සඳහා කාව්‍යකරණය යෙදීමට මහින්ද හිමියෝ පෙළඹුණහ. එබඳු නිර්මාණ වැඩි වශයෙන් කව්මිණ, කවි මුතු, ළමා කවි කළඹ යන පද්‍ය සංග්‍රහ වල පලවී ඇත. "කවි මුතු" පස්වැනි ශ්‍රේණියේ ළමයින් සඳහා ලියන ලද කාව්‍ය සංග්‍රහයකි. කවිකතා රචනයෙහි මහත් කුසලතාවයක් මහින්ද හිමියන් විසින් ප්‍රකට කෙරේ. කොටස් සතකින් හෙබි කුවේණි හා කොටස් පහකින් යුත් සැබෑ යාළුවෝ යන කාව්‍ය රචනා නිදසුන් ලෙස දැක්විය හැකිය. සිංහල ජාතික යටගියාව හා උරුමය පිළිබඳ මහින්ද හිමි සතු අවබෝධය හා විචාරශීලී ඥානය ගැඹුරින් ඉස්මතු වී පෙනෙන නිර්මාණයක් ලෙස කුවේණි පද්‍ය රචනය දැක්විය හැකිය. එහි දෙවන කොටසේ ගැනෙන සිරිලක විත්ති යනුවෙන් නම් කොට ඇති පද්‍ය රචනය මෙරට ඓශ්වර්යය හා අතීත ශ්‍රී විභූතිය පිළිබඳ කවියා සිද්ධි භක්ති පූර්වක ගරුත්වය ඉස්මතු කෙරෙන අයුරින් රචනා කොට ඇත. ළමයින්ගේ විෂයාවබෝධය පුළුල් කිරීමට ද, සිතීමේ ශක්තිය වැඩිදියුණු කිරීමට ද, දෑ අභිමානය වඩවාලීමට ද මෙබඳු නිර්මාණ වලින් සිදු වූයේ විපුල මෙහෙයකි.

**<u>මහින්ද හිමියන්ගේ කාව්‍යකරණයේ විශේෂ ලක්ෂණ</u>**

- දේශීය ජනයා පරාධීනත්වයෙන් මුදවා ගැනීමේ අධ්‍යාසය පෙරදැරිකරගෙන කාව්‍යකරණයට පෙළඹීම.
- ජාත්‍යානුරාගී හා දේශානුරාගී හැඟීම් ජනනය කිරීමට තුඩුදෙන සංකල්පනා ලාංකිකයින් ගේ අතීත ශ්‍රී විභූතිය මෙනෙහි කරමින් නිරූපණය කිරීමට පෙළඹීම.
- යටත් විජිත පාලනයට අතහිත දෙන හා බටහිර සංස්කෘතිකාංග ඇද වැළඳ ගැනීමට පෙළඹෙන කළු ඉංග්‍රීසින් ගේ පරාධීන මනස හා ගැති භාවය සඳහා උපහාසාත්මක විවේචනයට ලක් කිරීම.
- සමාජ විෂමතා, අසාධාරණය හා අයුක්තිය නොඉවසන දෘෂ්ටිය පළ කෙරෙන අයුරින් පීඩිත පාන්තික ජනතා සංවේදනා සානුකම්පිත ලෙස නිරූපණය කිරීම.
- ලාංකිකයන්ගේ රණකාමීත්වය හා උදාසීනත්වය නිරූපණය සඳහා ආවේග බහුල ස්වරයකින් අත්දැකීම් විවරණය කිරීම.
- ළමා මනසට සමීප කළ හැකි සෞන්දර්යාත්මක සංකල්පනා විචිත්‍ර ලෙස නිරූපණය කිරීම.
- ළමා පද්‍ය නිර්මාණකරණයේ දී අත් දැකීම් නිරූපණයෙන් පහල වන ප්‍රකාශන රටාව ගැන සැලකිලිමත් වීම.
- අත්දැකීමට අනුරූපි ලෙස බස නිර්මාණාත්මක අයුරින් සකස් කර ගැනීම, සරල නිවැරදි සිංහල ව්‍යවහාරය, ප්‍රබල සංකල්පනා නිරූපණයට අවශ්‍ය ලෙස පරිහරණය කිරීම. සිවුපද ආකෘතිය ස්වකීය අරමුණු ඉටුකර ගැනීමට උචිත ලෙස හැසිර වීම.

## <u>කෙටි ප්‍රශ්න</u>

1. මහින්ද හිමියන් ජන්මලාභය ලැබූ දිනය සහ මෙලොව හැර ගිය දිනය සඳහන් කරන්න.
2. පාඩමේ සඳහන් වන ආකාරයට මහින්ද හිමියන් සුවිශේෂී ජාතික වීරවරයකු වන්නේ කෙසේද?

3. මහින්ද හිමියන්ගේ ගිහි නාමය කුමක්ද?
4. මහින්ද හිමියන් වයස අවුරුදු දොළහේ දී මෙරට පැමිණියේ කවුරුන් සමගින් ද?
5. මහින්ද හිමි ගිහි අවධියේ සහ පැවිදි වීමෙන් පසු අධ්‍යාපනය ලැබූ අධ්‍යාපන ආයතන මොනවාද?
6. මහින්ද හිමියන්ගේ පළමු පැවිදි ගුරුවරයා සහ නිකාය නම් කරන්න.
7. එසේ පැවිදි බව ලැබුවේ කුමන විහාරස්ථානයකදී ද?
8. දෙවන අවස්ථාවේ දී සියම් නිකායේ භික්ෂුවක ලෙස පැවිදි බව ලැබුයේ කුමන ගුරුවරයෙකු යටතේ ද?
9. මහින්ද හිමි උපසම්පදාව ලබන්නේ කුමන වර්ෂයේ දී ද?
10. මහින්ද හිමි මෙරට කීර්තිමත් පාසලක සිංහල, පාලි, බුද්ධ ධර්මය යන විෂයයන් ඉගැන්වීම ය. එම පාසලේ නම කුමක්ද? කාලවකවානුව සඳහන් කරන්න.
11. 1936 වර්ෂයේ සිට මහින්ද හිමි වැඩ වාසය කළ විහාරස්ථානය නම කුමක්ද?
12. මහින්ද හිමියන් රචිත කාව්‍ය නිර්මාණ කොටස් කීයකට වර්ග කළ හැකි ද? ඒවා සඳහන් කරන්න.
13. මහින්ද හිමියන් විසින් රචිත පළමු කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න.
14. උන්වහන්සේ විසින් රචිත දේශාභිමානී කාව්‍ය කෘති මොනවාද?
15. ළමයින් උදෙසා මහින්ද හිමි නිර්මාණය කළ කාව්‍ය ග්‍රන්ථ වල නම් සඳහන් කරන්න.
16. "ජාතික තොටිල්ල" නිර්මාණයේ පසුබිම් කතා පුවතට සම්බන්ධ වූ ගිහි සහ පැවිදි පුද්ගලයින්ගේ නම් සඳහන් කරන්න.
17. ජාතික තොටිල්ල කාව්‍ය රචනා වූ විරිත කුමක්ද?
18. ඉහත පද්‍ය ලිවීම ආරම්භ කළ ගම් ප්‍රදේශය නම් කරන්න.
19. "ජාතික තොටිල්ල" රචනා කොට අවසන් කළේ කුමන විහාරස්ථානයක දී ද?
20. මහින්ද හිමියන් විසින් රචිත ඔබ වඩාත් කැමති ළමා කවියක් සඳහන් කරන්න.

## විචාර ප්‍රශ්න

1. **"චරිත සංවර්ධනයට නිර්මාණාත්මක අදහස් ඉදිරිපත් කරන ප්‍රතිභාපූර්ණ කවියෙක් මෙම නිර්මාණයේ දී අපට හමු වේ." මෙම කියමන සාකච්ඡා කරන්න.**

- කරදර බාධක හමුවේ නොසැලී සිටීම.

  කරදර දහසක් හමුවී හමු වී
  ඉන්ටැකි නම් සිනා වෙවී
  ඔහු මෙ ලොවට පහළ දෙවී
  රජෙකැයි සලකනු මැනවී

- අගහිඟකම්, නැතිබැරිකම් බාධා කොට නොගෙන ජීවිතය ජයගත යුතු බව.

  කාටත් හිමි පොදු දේ නම්
  නැති බැරි හිඟ අවහිරකම්
  මේ දේ මැඩගෙන දස්කම්
  පෑම තමයි සුරුවිරු කම්

- තමන්ගේ රටට ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් ඉටු කළ යුතු බව.

  ඉටු කොට කළ යුතු යුතුකම්
  ලැබුනත් ලෝකෙන් ගැරහුම්
  ඉවසන්නට පුලුවන්නම්
  උඹයි මගේ පුතා උතුම්

- ස්වාධීන බව ආරක්ෂා කර ගැනීමේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ සඳහන් කිරීම.

  නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ
  ඒ බව සිහිකොට මෙලොවේ
  යුතුකම ඉටු කළ යුතු වේ

**2. "මුනි සිරිපා සිඹිමින්නේ" පද්‍ය නිර්මාණය සඳහා උපයුක්ත කරගත් කාව්‍ය උපක්‍රම හා භාෂා ශෛලිය පිළිබඳ ඇගැයීමක් කරන්න.**

- රූපකාර්ථවත් බස් වහරක් භාවිතා කිරීම.

  නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ
  ඒ බව සිහිකොට මෙලොවේ
  යුතුකම ඉටු කළ යුතු වේ

  ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ
  එය රැකගන්නට ගන්නට මෙලොවේ
  සමත් වෙතොත් පුත නුඹ වේ

- අනුප්‍රාසවත් බස් වහරක් භාවිතා කිරීම.

  ජාතික රණ දෙරණ මතේ
  ගැටී වැටී මළ මොහොතේ
  සුන්දර සුරඹුන්ගෙ අතේ
  නැළවෙන බව සිතනු පුතේ

- ව්‍යවහාර භාෂාව භාවිතය

  මිතුරුකමින් පෙරට එතොත්
  දුවිල්ලක් එක්ක වුණත්
  මිතුරු වෙයන් පුතේ උඹත්
  එයයි ලොවේ ගුණය මහත්

- ධ්වනිථාර්ථ නගන පද සංයෝජනයක් දක්නට ලැබීම.

  ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ
  එය රැක ගන්නට මෙලොවේ
  සමත් වෙතොත් පුත නුඹ වේ

  ජාතික රණ දෙරණ මතේ
  ගැටී වැටී මළ මොහොතේ
  සුන්දර සුරඹුන්ගෙ අතේ
  නැළවෙන බව සිතනු පුතේ

- චිත්ත රූප මැවෙන අයුරින් භාෂාව භාවිත කිරීම

  මුනි සිරිපා සිඹිමින්නේ
  සමනොළ ගිරි පෙදෙසින්නේ
  මඳ සුළඟයි මේ එන්නේ
  මගේ පුතා නිදි යන්නේ

**3. දරුවන්ගේ සිත්හි දේශාභිමානය හා ජාතිකානුරාගය ජනිත කරවීමට දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල පද්‍ය ග්‍රන්ථය සමත් වෙන ආකාරය "මුනි සිරිපා සිඹිමින්නේ" පාඩම ඇසුරෙන් විමසන්න.**

- නිදහසේ ඇති උත්තරීතර බව වටහා දෙමින්, නිදහසෙහි වටිනාකම පිළිබඳ ප්‍රබල හැඟීමක් දරුවාගේ සිත්හි රෝපණය කිරීමට මහින්ද හිමියෝ සමත් වෙති.

  නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ
  ඒ බව සිහිකොට මෙලොවේ
  යුතුකම ඉටු කළ යුතු වේ

- රට දැය වෙනුවෙන් ජීවිතය පූජා කිරීම උත්තරීතර කටයුත්තක් බව නිරූපණය කරයි. එය දෙව්ලොව ඉපදීමට තරම් පිනකි වාසනාවකි.

  ජාතික රණ දෙරණ මතේ
  ගැටී වැටී මළ මොහොතේ
  සුන්දර සුරඹුන්ගෙ අතේ
  නැළවෙන බව සිතනු පුතේ

- ලැබූ දිවිය අර්ථවත් වීමට නම් ජීවිතයෙන් කොටසක් රට දැය වෙනුවෙන් කැප කළ යුතු බව කවියා අවධාරණය කරයි. රට දැය සමය වෙනුවෙන් කටයුතු නොකරන්නාගේ ජීවිතය නිෂ්පල අර්ථශූන්‍ය එකක් බව ද නිරූපණය කරයි.

  තමන් ලැබූ දිවි පෙවෙතේ
  කොටසක් රට සමය වෙතේ
  පුද නොකළොත් නුඹෙන් පුතේ
  මෙලොවට කිසි පලක් නැතේ

**4. යහපත් චරිතයක් ගොඩ නගා ගැනීමට තුඩු දුන් වටිනාකම් රැසක් දරුවාගේ ජීවිතයට එකතු කිරීමට දරු නැළවිල්ල හෙවත් ජාතික තොටිල්ල පැදි පෙළ සමත් වන අයුරු 'මුනිසිරිපා සිඹිමින්නේ' පැදි පෙළ ඇසුරෙන් විමසන්න.**

- නිදහසේ අගය පිළිබඳ වටහා දෙමින් නිදහස රැක ගැනීම දරුවාගේ වගකීමක් බව අවධාරණය කරයි.

  නිදහස මහ මුහුදක් වේ
  එහි උල්පත පුත නුඹ වේ
  ඒ බව සිහිකොට මෙලොවේ
  යුතුකම ඉටු කළ යුතු වේ

- බාධක, කරදර, අභියෝග හමුවේ නොසැලී සිටීම, ඒවා සුහද සිතින් භාර ගැනීම දියුණුවේ රහස බව ළමා සිත් හි රෝපණය කරවයි.

  කරදර දහසක් හමු වී
  ඉන්ටැකි නම් සිනා වෙවී
  ඔහු මෙ ලොවට පහළ දෙවී
  රජෙකැයි  සලකනු මැනවි

- රට දැය සමය ජීවිතයේ උතුම්ම දායාදය බව අවධාරණය කරයි.

  ජාතිය රන් විමනක් වේ
  ආගම මිණි පහනක් වේ
  එය රැක ගන්නට මෙලොවේ
  සමත් වෙතොත් පුත නුඹ වේ

- බාධාකිරීම්,නින්දා, අපහාස ආදී කුමන අභියෝගයක් පැමිණිය ද ඒවා නොසලකා ඉවසීමෙන් යුතුකම් හා වගකීම් ඉටු කිරීමෙන් උත්තරීතර චරිතයක් නිර්මාණයට හේතු වෙයි.

  ඉටු කොට කළ යුතු යුතුකම්
  ලැබුණත් ලෝකෙන් ගැරහුම්
  ඉවසන්නට පුළුවන්නම්
  උඹ මගේ පුතා උතුම්

- සංවේදී හදවතක් ඇති කර ගැනීමෙන් අනෙකාගේ දුක වේදනාව හඳුනාගැනීමට හැකිවේ. ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මානය, අනෙකාට රිදවීම ආදී දුර්ගුණයන්ගෙන් ඈත්වීමට සංවේදී හදවතක් ඇත්තෙකුට පහසු ය.

  සිනිඳු මොළොක් බව මලෙහී
  පිරිසිදු බඳු බව පිනි බිඳෙහී
  එක් වී මා පුතුගේ ලෙහී
  අරක් ගනී හැම දිනෙහී

# ගංගාවේ සංගීතය

## • කොළඹ යුගයේ දෙවන කවි පරපුර

කොළඹ කවිය වඩාත් ජනප්‍රිය වූයේ දෙවන අදියරේ දී ය. 1920 ගණන්වල සිට නවසිය පනස් ගණන් දක්වා කාලය කොළඹ යුගයේ තරුණ කවීන්ගේ වකවානුව වශයෙන් සැලකිය හැකි ය. සාගර පලන්සූරිය, පී.බී.අල්විස් පෙරේරා, විමලරත්න කුමාරගම, එච්. එම්. කුඩලිගම, මාකඳුරේ ගුණවර්ධන, උපනන්ද බටුගෙදර, මීමන ප්‍රේමතිලක, ඩී. ඒ. කුමාරසිංහ, චන්ද්‍රරත්න මානවසිංහ, කපිල සෙනෙවිරත්න යන අය මේ යුගයේ ප්‍රකට කවීහු වෙති. මේ කවීහු වැඩිහිටි කවීන්ට වඩා විප්ලවකාරී අදහස් දැරූ අතර බහුල ලෙස බැහැරින් ආභාසය ලබමින් කවි ගෙතූහ. පැරණි කවීන් මෙන් ඡන්දස්, අලංකාර, මුල මැද අග එළිවැට ගැන ඔවුහු එතරම් සැලකිල්ලක් නොදැක්වූහ. එදිනෙදා ව්‍යවහාරයේ පවත්නා භාෂාව ඇසුරින් නව කාව්‍ය භාෂාවක් සකස් කර ගැනීමට මොවුහු පෙළඹුණහ. මෙලෙස කවියේ වෙනස්කම් රැසක් ඇති වීමට තුඩු දුන් කරුණු දෙකක් ඇත.

එනම්, 1. ටෙනිසන්, ශෙලී, වර්ඩ්ස්වර්ත්, කීට්ස්, කොල්රිජ්, ගෝල්ඩ්ස්මිත් ආදී බටහිර රොමැන්ටික් කවීන්ගෙන් ලද ආභාෂය හා

2. පෙරදිග මහා කවි තාගෝර් ගෙන් ලද ආභාසය යනුවෙනි.

සාගර පලන්සූරිය, පී. බී. අල්විස් පෙරේරා, මීමන ප්‍රේමතිලක, එච්. එම්. කුඩලිගම ආදී කවීන් කෙරෙහි බහුල වශයෙන් බලපෑවේ බටහිර ආභාසයයි.

තරුණ කවීන්ගේ කාව්‍ය නිර්මාණවලට වස්තු විෂය වූයේ ස්වභාව සෞන්දර්ය, සමාජ විවේචනය, ආලය, ප්‍රේමය බඳු අත්දැකීම් ය. ස්වභාව සෞන්දර්ය පිළිබඳ කවි රචනා කළ මේ කවීන් ගේ කාව්‍ය නිර්මාණවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් නම් ස්වභාව සෞන්දර්යට සචේතනිකත්වයක් ආරෝපණය කොට කවියා හා සොබාදහම අතර පවත්නා සම්බන්ධය ස්ත්‍රී පුරුෂ සම්බන්ධයක් ලෙස දැක්වීමයි. ස්වභාව සෞන්දර්යය පිළිබඳ මෙවන් ආකල්පයක් ඇතිකරලූයේ රොමැන්ටික් කවීන්ගේ පද්‍ය රචනා ය. එසේ ම ඇතැම් කාව්‍ය නිර්මාණවලින් මේ කවීහු සමාජයේ විෂමතා දක්වමින් සොබාදහම සමග එක් වීමේ අගය දක්වන්නට වූහ.

"බඹරෙකු සෙයින් සිර වුණු නෙළුමක   ඇතුළ
සංගීතයක් නැග එයි හදවත   පතුළ
සැන්දෑ වලාවක සිට තොල් පෙති   මතුළ
ස්වභා දහම ඔබ රෝහිණී මම   අතුළ"
(සොබාදහම - පී. බී. අල්විස් පෙරේරා)

කොළඹ යුගයේ දෙවන පරපුරේ කවීන් අතර ඉහළ ප්‍රතිභාවක් පළ කළ එමෙන්ම පොදු ජන ජීවිතයේ කටුකත්වය යථරූපීව නිරූපණය කළ කවීන් දෙදෙනකු ලෙස සාගර පලන්සූරිය හා විමලරත්න කුමාරගම යන කවින් හැඳින්විය හැකිය. සාගර පලන්සූරියගේ ධීවරී ගීතය බඳු නිර්මාණයක දැක ගත හැකි වනුයේ ජන ජීවිතයේ දුක්ඛිත පක්ෂය යි.

"හබලට ඔබේ සව්බල අත රිදෙන   වද
ඔරු කඳ උඩින් දළ රළ පෙළ නගින   වද
සීතල සුළං රළුවට ඇඟ වැදෙන   වද
හිමියනි වෙහෙස නිදිමත දෙක දැනෙන   වද"

විමලරත්න කුමාරගම කවියා වන්නිකරය වැනි ඈත පිටිසර වටපිටාවෙන් ලත් අත්දැකීම් සුහදව විඳ ගැනීමෙන් පමණක් නොව, ඒ නිසාම උපන් ආත්ම සංයමයකින් කවි ලියුවේ ය. ගැමි ජීවිතයේ කටුක බව හා භයංකාරත්වය යතානුරූපී ව නිරූපණය කිරීමට කුමාරගම කවියා හැම විටම කටයුතු කරයි. ගැමි ජනයාගේ දුක්ඛිත ජීවිතය මානව දයාවෙන් යුතුව නිරූපණය කිරීමට කුමාරගමයන්ට හැකි වී ඇත්තේ වන්නිකරයේ ජනයා ඇසුරේ හිඳිමින් ලත් සැබෑ ජීවන අත්දැකීම් ඔහු සතු බැවිනි.

"සංහිඳ ළඟ බාරයට කිරි ඉතිරීම
කෙම්මුර දවස්වල පානින් සැරසීම
වනාත කඩා ගස් දෙබලක දැවටීම
මා නොකෙරුවත් නොකලෙමි එය ගැරහීම"

(අයියනායක)

"අලියා වැටුණු වැව සිටි හේරත් හාමි
මා වැනියකු වුවද මම වැදගත් වීමි
මිනී කපන මුත් ඒ හේරත් හාමි
ඔහු මට වඩා විසිතිස් ගුණයෙන් දැමී"

(හේරත් හාමි)

කොළඹ යුගයේ කවියෝ ජනප්‍රියත්වයේ මුදුන් හිනිපෙත්තටම නැගුණ ද, චිරස්ථ සාරවත් කාව්‍ය සම්ප්‍රදායක් බිහි කර ගැනීමට ඔවුන් වුව ද සමත් වූයේ නැත.

- **පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

1. 'ගංගාවේ සංගීතය' පද්‍ය රචකයා කවරහු ද? මෙම පබැඳුම උපුටාගත් කාව්‍ය කෘතිය කුමක්ද?
.....................................................................................................................
2. 'ගංගාවේ සංගීතය' පද්‍ය රචකයා අයත් සාහිත්‍ය යුගය කුමක්ද? ඔහු නියෝජනය කළ කවි පරපුර කුමක්ද?
.....................................................................................................................
3. 'ගංගාවේ ගීතය' පද රචකයා හා සමකාලීන කාව්‍යකරණයේ නියැළුණු පද්‍ය රචකයින් දෙදෙනෙකු නම් කරන්න.
.....................................................................................................................
4. ගංගාවේ සංගීතය පද්‍යාවලියෙහි වස්තු විෂය සැකෙවින් දක්වන්න.
.....................................................................................................................
5. කොළඹ යුගයේ වෙන කවි පරපුරේ කාව්‍ය නිර්මාණ පළ කරන ලද ප්‍රකට කවි සඟරා දෙකක් නම් කරන්න.
.....................................................................................................................
6. 'ගංගාවේ සංගීතය' පද්‍යාවලියේ එන සංකේතාත්මක යෙදුමක් නම් කරන්න.
.....................................................................................................................
7. 'ගංගාවේ ගීතය' පද්‍යාවලියේ එන අනුප්‍රාසවත් යෙදුමකට නිදසුන් දක්වන්න.
.....................................................................................................................
8. 'ගංගාවේ සංගීතය' පද්‍යාවලිය ඇතුළත් උත්තම පුරුෂ කථන ක්‍රමය පෙන්නුම් කරන ක්‍රියා පද උපුටා දක්වන්න.
.....................................................................................................................
9. ගංගාවේ සංගීතය පද්‍යාවලියේ ගංගාව සහ මහමුහුද කවියා උපකල්පනය කර ඇත්තේ කවර අයට ද?
.....................................................................................................................
10. 'කලදෝ දියෙන් පොහවා රන් පුලින තලා' යන්නෙහි අරුත කුමක්ද?
.....................................................................................................................
11. එච් එම් කුඩලිගම කවියා හැඳින්වූ විරුද නාමය කුමක්ද? එසේ විරුද නාමය ලැබීමට හේතුව කුමක්ද?
.....................................................................................................................
12. එච්. එම්. කුඩලිගම කවියාගේ කාව්‍ය නිර්මාණ පළ වූ කවි සඟරා දෙකක් නම් කරන්න.
.....................................................................................................................
13. එච්. එම්. කුඩලිගම කවියා වස්තු විෂය කර ගත් කාව්‍යානුභූති දෙකක් නම් කරන්න.
.....................................................................................................................
14. කොළඹ යුගයේ දෙවන කවි පරපුරට අයත් පොදු ජන ජීවිතයේ කටුකත්වය යථාරූපී ව නිරූපණය කළ

කවීන් දෙදෙනෙකු නම් කරන්න.

............................................................................................................................

15. කොළඹ යුගයේ දෙවන කවි පරපුරට අයත් පොදු ජන ජීවිතයේ කටුකත්වය යථා රූපය ම නිරූපණය කළ කවීන් දෙදෙනෙකු නම් කරන්න.

............................................................................................................................

**1. ගංගාවේ සංගීතය පද්‍ය නිර්මාණයෙන් කවියා ඉදිරිපත් කරන්න ජීවන දර්ශනය පැහැදිලි කරන්න.**

- මිනිස් ජීවිතය ගංගාවකට ආරෝපණය කර ගැඹුරු ජීවන දර්ශනය කවියා ඉදිරිපත් කරයි.
- ළමාවිය ජීවිතයේ සුන්දර ම අවධිය යි.

| | |
|---|---|
| කඳු බෑවුමක දං බෝවිටි පඳුරු | තළා |
| පහළට ඇදී පර මල් පෙති ඉවත | නොළා |
| කලදෝ දියෙන් පොහවා රන් පුලින | තලා |
| සංගීතවත් වී යම් ඉදිරියට | ගලා |

- යොවුන් වියට එළැඹෙත්ම ජීවන අභියෝග වලට මුහුණ දීමට සිදුවෙයි.

| | |
|---|---|
| සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල | වෙමි |
| ඇඹරෙමි - එහෙත් පසු නොබසිමි | නොනවතිමි |
| කවදා කොතැනක දී හෝ මහ මුහුද | හිමි |
| හමු වුණු කෙණෙහි මා සතු බව ඔහුට | දෙමි |

- දුක් කම්කටොලු බාධක අභියෝග වලට මුහුණ දීමට සිදුවන තරමට ජීවිතය පරිපූර්ණත්වයට පත් වේ. සුන්දර වෙයි.

| | |
|---|---|
| හිරිමල් සිනා රැළි පෙණ පිඩු | මිහිරි තම |
| ගල් පරවල ම හැපී හැපී බිඳී | කරමින් මම |
| සම තැනිතලාවල හමුවෙයි | අලසකම |
| නිරසයි අතරමග අවහිර නොදුටු | බිම |

- අනුන් පිළිබඳව සෙවීමට වඩා තමන් පිළිබඳව ලබන අවබෝධයෙන් ජීවිතය සාර්ථකත්වයට හේතු වේ. බුද්ධ දේශනාවේ ද මේ පිළිබඳ සඳහන්වේ.

| | |
|---|---|
| එන්නේ කොහි සිටද කොතැනකට ද | යන්නේ |
| ඔබ කුමකට ද මා දුටු තැන | විමසන්නේ |
| මිනිසුන් ගිහින් නිතරම ආපසු | එන්නේ |
| කිම දැයි කියා කිසිවෙකු ඇයි | නොසොයන්නේ |

- දුක් කම්කටොලු, බාධක අභියෝග හමුවේ සතුටින් ජීවත්වීම සාර්ථක ජීවිතයක පදනම යි.

| | |
|---|---|
| මී අඹ කිරල මා දම් ගෙඩ ළදරු | වියේ |
| ඇකයෙහි හෙළා හඬවයි සැඩ සුළඟ | රැයේ |
| සුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු | දියේ |
| සමහර තැනක ලස්සන මල් කැකුළු | තියේ |

- අභියෝග ජය ගනිමින් සාර්ථකත්වයට පත්ව, සුන්දර ජීවිත ගත කළ ද අවසානයේ හුදෙකලා බවට පත්වීමට සිදුවීම ලෝ දහමයි.

| | |
|---|---|
| රන් තරු පිරිවරාගත් සඳ මඩල | යට |
| මහ වන බිමක් මැද ගිරි කුළු අතර | සිට |
| නොමියන හේලි දහමක පණිවුඩය | පිට |
| කොඳුරමි කෙඳිරියක් මුළු ලොව නිසල | කොට |

**2. අත්දැකීම් රසවත් ඉදිරිපත් කිරීමට කවියා භාෂාව යොදාගෙන ඇති ආකාරය පැහැදිලි කරන්න.**

- සරල බස් වහරක් භාවිත කරයි.

  එන්නේ කොහි සිටද කොතැනකටද යන්නේ
  ඔබ කුමකටද මා දුටු තැන විමසන්නේ
  මිනිසුන් ගිහින් නිතරම ආපසු එන්නේ
  කිම දැ යි කියා කිසිවෙකු ඇයි? නොසොයන්නේ

- වියරණ රීති වලට අනුගත ව, එහෙත් කාව්‍යාත්මක බව නොනසා ගනිමින් බස නිර්මාණාත්මකව භාවිත කරයි.

  "සංගීතවත් වී යමි ඉදිරියට ගලා", "මා සතු බර ඔහුට දෙමි", "කිසිවෙකු ඇයි? නොසොයන්නේ"

- චිත්ත රූප මැවීමට තුඩු දෙන අයුරින් බස භාවිත කරයි.

  "සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
  ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
  කවදා කොතැනක දී හෝ මහ මුහුද හිමි
  හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි"

- ව්‍යංග්‍යාර්ථ බහුල වදන් හා යෙදුම් භාවිත කිරීම නිර්මාණයේ අගය වැඩි කිරීමට සමත්ව ඇත.
  'ඇකයෙහි හෙළා (සෙනෙහස, කාරුණික බව)', "හිරිමල් සිනා රැළි (සුන්දර බව)", "සුළි මැද කැරකෙමින් ඉදුනිල් ගැඹුරු දියේ (භයානක බව, කටුක බව, ජීවන අභියෝග)"

**3. රස නිෂ්පත්තිය සඳහා කවියා භාවිත කරන විවිධ කාව්‍යෝපක්‍රම විස්තර කරන්න.**

- අනුප්‍රාසාලංකාරය නිර්මාණාත්මක ලෙස යොදා ගනී.

  "සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි
  ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි
  කවදා කොතැනකදී හෝ මහ මුහුදු හිමි
  හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි"

  "ගල් පර ගල්පර වල හැපී හැපී බිහි කරමි ම ම"

- උත්තම පුරුෂ කථන ක්‍රමය උපයෝගී කරගැනීම ද අත්දැකීම් වඩාත් හොඳින් පාඨකයාට තිළිණ කිරීමට හේතු වී තිබේ.

  "සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි"

- කවියා උපයෝගී කරගෙන ඇත්තේ සමුද්‍රඝෝෂ විරිතයි. අග එළිවැට ආරක්ෂා කරගනිමින් පද්‍ය නිර්මාණයට නිර්මාණයට පද්ද නිර්මාණයට පෙළඹී ඇති අයුරු සෑම පද්‍යක ම දැක ගත හැකි ය.

  "මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු වියේ
  ඇකයෙහි හෙලා හඬවයි සැඬ සුළඟ රැයේ
  සුළි මැද කැ෧මින් ඉදුනිල් ගැඹුරු දියේ
  සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ"

- සංකේත භාවිතය ද නිර්මාණයට ප්‍රබලත්වයක් ගෙනදීමට හේතු වී ඇත.

ගහ (ජීවිතය), දං බෝවිටි පදුරු (දඟකාර ළමා විය), වියළි කොළ (ජීවන කම්කටොලු, පීඩා, උවදුරු), හිරිමල් සිනා රැළි (සුන්දරත්වය)

- රූපක භාවිතය ද නිර්මාණයට අගයක් එක් කරයි.

  "කවදා කොතැනක දි හෝ මහ මුහුද හිමි"
  "කලදෝ දියෙන් පොහවා රන් පුලින තලා"

**4. කවියා අජීවී පරිසරයට සජීවී බවක් ආරෝපණය කරමින් තම පද්‍ය පන්තිය සාර්ථකව ඉදිරිපත් කරන ආකාරය විමසන්න.**

- කවියා උත්තම පුරුෂ කථන ක්‍රමය භාවිත කරමින් ගඟට සජීව ත්ත්වයක් ආරෝපණය කරයි. "

  "සැඟවෙමි එබෙමි නිසසල වෙමි සසල වෙමි<br>
  ඇඹරෙමි එහෙත් පසු නොබසිමි නොනවතිමි<br>
  කවදා කොතැනකදී හෝ මහ මුහුද හිමි<br>
  හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි"

- ගංගා යුවතිය මුහුදු ස්වාමියා හමු වීමේ අපේක්ෂාවෙන් ගමන් කරන්නීය.

  "කවදා කොතැනකදී හෝ මහ මුහුද හිමි<br>
  හමු වුණු කෙණෙහි මා සතු බර ඔහුට දෙමි"

- සුළඟින් ගඟට පලතුරු පතිත වීම කවියා සජීවත්වයට නංවයි.

  "මී අඹ කිරල මාදම් ගෙඩි ළදරු වියේ<br>
  ඇකයෙහි හෙළා හඬවයි සැඩ සුළඟ රැයේ<br>
  සුළි මැද කැරකෙමින් ඉඳුනිල් ගැඹුරු දියේ<br>
  සමහර තැනක ලස්සන මල් කැකුළු තියේ"

- ගං දියෙහි ජනිත වන පෙණ පිඩු කවියා සජීවී සිනා රැළි බවට පත් කරයි.

  "හිරිමල් සිනා රැළි පෙණ පිඩු මිහිරිතම<br>
  ගල් පරවල ම හැපී හැපී බිඟි කරමි මම<br>
  සම තැනිතලාවල හමුවෙයි අලසකම<br>
  නිරසයි අතරමග අවහිර නොදුටු බිම"

- ගඟ තමන්ගෙන් ප්‍රශ්න අසන අයගෙන් එසේ ප්‍රශ්න ඇසීමේ නිශ්ඵල බව පිළිබඳ ප්‍රශ්න කරයි.

  "එන්නේ කොහි සිටද කොතැනකටද යන්නේ<br>
  ඔබ කුමකට ද මා දුටු තැන විමසන්නේ<br>
  මිනිසුන් ගිහින් නිතර ම ආපසු එන්නේ<br>
  කිම දැයි කියා කිසිවෙකු ඇයි? නොසොයන්නේ

## ලෙන අතහැර යාම

- **නාට්‍ය කලාව පිළිබඳ හැඳින්වීමක්**
    - නාට්‍ය යනු ලෝකයේ පැවැත්ම අනුකරණය කිරීමයි. - භරතමුනි -
    - නාට්‍ය යනු ක්‍රියාවක් අනුකරණය කිරීමයි. - ඇරිස්ටෝටල් -
    - නාට්‍ය යනු සමාජයට කැඩපතක් ඇල්ලීමයි. - ශේක්ස්පියර් -

### ලොව මහා නාට්‍යකරුවෝ

- සොෆොක්ලීස්
- ඇරිස්ටොපානිස්
- ඊස්කිලස්
- යුරිපිඩීස්
- කාලිදාස
- විලියම් ශේක්ස්පියර්
- ශ්‍රී හර්ෂ
- ටෙනිසි විලියම්
- සැමුවෙල් බෙකට්
- ඇන්ටන් චෙකොෆ්
- ෂෝන් පෝල් සාත්‍රේ
- බර්ටෝල් බ්‍රෙෂ්ට්
- ගර්සියා ලොර්කා
- බර්නාඩ් ෂෝ

### ලංකාවේ නාට්‍යකරුවෝ

එදිරිවීර සරච්චන්ද්‍ර
සුගතපාල ද සිල්වා
දයානන්ද ගුණවර්ධන
ගුණසේන ගලප්පත්ති
හෙන්රි ජයසේන
බන්දුල ජයවර්ධන
ප්‍රේම රංජිත් තිලකරත්න
විජිත ගුණරත්න
රංජිත් ධර්මකීර්ති
කේ බී හේරත්
ධර්මසිරි බණ්ඩාරනායක
ජයලත් මනෝරත්න
ධම්ම ජාගොඩ
රාජිත දිසානායක
බුද්ධික දමයන්ත

### අභිනය

නාට්‍ය පෙළෙහි අන්තර්ගතය ප්‍රේක්ෂකයින් වෙත පැමිණීම සඳහා යොදා ගන්නා උපක්‍රම අභිනය යනුවෙන් කෙටියෙන් හැඳින්විය හැක. සංස්කෘත විචාරකයින්ට අනුව ඉදිරියට ගෙන හැර පෑම අභිනය යන්නෙහි තේරුමයි. අභිනය සතරකි

- ආංගික අභිනය
- වාචික අභිනය
- සාත්වික අභිනය
- ආහාර්ය අභිනය

### ස්වතන්ත්‍ර නාට්‍ය

කිසියම් රචකයෙකු කිසියම් අත්දැකීමක් මුල්කරගෙන එතෙක් නොතිබූ අන්දමේ නාට්‍යයක් නිර්මාණය කරයි නම් එය ස්වතන්ත්‍ර නාට්‍යය කි. එදිරිවීර සරච්චන්ද්‍ර, හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන, සුගතපාල ද සිල්වා, ආර්. ආර්. සමරකෝන්, චන්ද්‍රසේන දසනායක, බන්දුල ජයවර්ධන, ධම්ම ජාගොඩ, රංජිත් ධර්මකීර්ති, ප්‍රේමරංජිත් තිලකරත්න, කේ බී හේරත්, ජයලත් මනෝරත්න, රාජිත දිසානායක ආදී නාට්‍යකරුවන්ගේ බොහෝ නිර්මාණ ස්වතන්ත්‍ර නාට්‍ය වේ.

### පරිවර්තන නාට්‍ය

පරිවර්තන නාට්‍ය යනු කිසියම් නාට්‍ය කෘතියක් මුල් භාෂාවෙන් වෙනත් භාෂාවකට පෙරළීමයි. එසේ කිරීමේදී කතා වස්තුව, තේමාව, චරිත, ස්ථාන නාම, පුද්ගල නාම ආදිය වෙනස් නොකර භාෂාව පමණක් වෙනස් භාෂාවකට පෙරළා සකස් කරයි. හෙන්රි ජයසේන, සුගතපාල ද සිල්වා, සුනන්ද මහේන්ද්‍ර, රංජිත් ධර්මකීර්ති,

බන්දුල විතානගේ, ධර්මසිරි බණ්ඩාරනායක, පරාක්‍රම නිරිඇල්ල, බුද්ධික දමයන්ත, විජිත ගුණරත්න, ප්‍රසන්න විතානගේ ආදී නාට්‍ය කරුවෝ පරිවර්තන නාට්‍ය නිර්මාණය කළ නාට්‍යකරුවෝ වෙති.

## අනුවර්තන නාට්‍ය

මුල් කෘතියේ අන්තර්ගතය රැකගනිමින් භාෂාව, චරිත නාම, ස්ථාන නාම, පරිසරය ආදිය වෙනස් කොට නිර්මාණය කරන නාට්‍ය අනුවර්තන නාට්‍ය වේ. ගුණසේන ගලප්පත්ති, බන්දුල ජයවර්ධන, රංජිත් ධර්මකීර්ති, ධම්ම ජාගොඩ, සුගතපාල ද සිල්වා ආදී නාට්‍ය කරුවෝ අනුවර්තන නාට්‍ය නිර්මාණයෙහි ලා දක්ෂයෝ වූහ.

## සුඛාන්ත සහ දුඛාන්ත

භරතමුණි පඬිවරයාගේ නාට්‍ය ශාස්ත්‍රය ග්‍රන්ථයේත්, ඇරිස්ටෝටල් පඬිවරයාගේ කාව්‍ය ශාස්ත්‍ර ග්‍රන්ථයේත් සුඛාන්ත සහ දුක්ඛාන්ත වශයෙන් නාට්‍ය දෙකොටසකට බෙදා දක්වයි. මෙම බෙදීමට හේතු වී ඇත්තේ නාට්‍යයේ කථා පුවතයි. කතා වස්තුවේ පවතිනුයේ දුක්ඛ දායක අවසානයක් නම් දුක්ඛාන්ත ලෙස ද කතා වස්තුව පවතිනුයේ ප්‍රීතිමත් අවසානයක් නම් සුඛාන්ත ලෙස ද හඳුන්වා ඇති බව පැහැදිලි ය.

## ලෝක ධර්මී සහ නාට්‍ය ධර්මී

නාට්‍ය වේදිකාවේ රංග ගත වෙන ආකාරය අනුව මෙම බෙදීම සිදු කරයි. නාට්‍යයේ රංගනය, රංග වස්ත්‍රාභරණ, අංග රචනය, රංග භූමි අලංකරණය සිදු කරන්නේ සිදුකරන්නේ ස්වභාවික ආකාරයට නම් එය ලෝක ධර්මී හෙවත් ස්වභාවික රංග ශෛලිය යි. ඉහත සඳහන් අංග සිදු කෙරෙන්නේ ස්වභාවිකත්වය ඉක්මවා නම් එය නාට්‍ය ධර්මී හෙවත් ශෛලීගත නාට්‍ය ශෛලිය යි.

## නාට්‍ය සන්දර්භය

කතා වස්තුවක් රංගනයෙන් අවසානය කරා එළඹීමට අනුක්‍රමික ව සන්ධිස්ථාන පහක් පසුකොට පැමිණිය යුතු බව භරතමුනි කියා සිටී. භරතමුනි විසින් නාට්‍ය 'බීජ', 'බින්දු', 'පතාක', 'ප්‍රකරි', කාර්යය නමින් නාට්‍ය සන්දර්භය කොටස් පහකට බෙදන ලදී. චිරන්තන සංස්කෘතික විචාරකයන්ට අනුව නාට්‍ය සන්දර්භයේ විශේෂතාව මැන ගැනීම උදෙසා නාට්‍ය විකාශනය 'ආරම්භ', 'යත්න', 'ප්‍රාප්ත්‍යාශා', 'නියතාප්ති', 'ඵලාගම' ලෙස කොටස් පහකට බෙදිය හැක.

- **ආරම්භය**
  කිසියම් ඵල ප්‍රාප්තියකට තුඩු දෙන සිදුවීමකින් නාට්‍ය ආරම්භ කළ යුතු වීමයි. එනම් යම්කිසි අභිමතාර්ථයක් ඉෂ්ට කර ගැනීමට කතා නායකයකු තුළ ඇතිවන ආශාව යි.

- **යත්න**
  කිසියම් අභිමතාර්ථයක් ඉෂ්ට කර ගැනීම සඳහා නායක හා ප්‍රතිනායක පක්ෂවල නායකයන් විසින් සිය අරමුණු ඉටු කර ගැනීම සඳහා ව්‍යාපාරයක් ඇරඹීමයි.

- **ප්‍රාප්ත්‍යාශා**
  මෙහිදී කතා නායකයාට තම අභිමතාර්ථය ඉෂ්ට කර ගැනීම සඳහා මඟක් පෑදේ. එහෙත් ඒ සඳහා බාධා පැමිණේ.

- **නියතාප්ති**
  යම්කිසි නිශ්චිත බාධාවක් මැඩ ගැනීම සඳහා කිසියම් ලකුණක් හෝ භාණ්ඩයක් හමු වීමෙන් බාධාව මැඩ ගෙන, අභිමතාර්ථය ඉටුවේ යැයි බලාපොරොත්තුව නියතාප්ති වේ.

- **ඵලාගම**
  අභිමතාර්ථය ඉටු වී නායකයාගේ කාර්යය සාර්ථක වීම ඵලාගම නම් වේ. කාර්යය සම්පූර්ණ සමාප්තියට පත්වීමෙන් අවසන් වේ.

- <u>කෙටි ප්‍රශ්න</u>

1. සිංහබාහු නාට්‍යයේ තේමාව කුමක්ද?

   ……………………………………………………………………………………
2. සරත්චන්ද්‍රයන් නිර්මාණය කළ නාට්‍ය හයක නම් ලියන්න.

   ……………………………………………………………………………………
3. සරච්චන්ද්‍රයන්ගේ නවකතා මොනවාද?

   ……………………………………………………………………………………
4. සරච්චන්ද්‍රයන් රචනා කළ ශාස්ත්‍රීය කෘති නම් කරන්න.

   ……………………………………………………………………………………
5. සරච්චන්ද්‍රයන්ගෙ කෙටිකතා සංග්‍රහ නම් කරන්න.

   ……………………………………………………………………………………
6. සරච්චන්ද්‍රයන්ගේ ස්වයං ලිඛිත චරිතාපදානය නම් කරන්න.

   ……………………………………………………………………………………
7. සිංහබාහු නාට්‍යයේ නාට්‍ය ගණය කුමක්ද?

   ……………………………………………………………………………………
8. සිංහ බාහු නාට්‍යයේ නාට්‍ය ශෛලිය කුමක් ද? එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ මුල් නාමය කුමක්ද?

   ……………………………………………………………………………………
9. සරච්චන්ද්‍රයන් ජාතික කතා ඇසුරෙන් නිර්මාණය කළ නාට්‍ය සහ එම නාට්‍ය සඳහා පාදක වුණු ජාතක කතා වල නම් සඳහන් කරන්න.

   ……………………………………………………………………………………

- <u>විචාරයට අත්වැලක්</u>

**1. දරුවන්ගේ සුභ සිද්ධිය තකා ක්‍රියා කරන මවකගේ චරිතය සුප්පා දේවිය ගෙන් සංකේතවත් වේ පාඨම ඇසුරෙන් නිදසුන් සහිතව විමසන්න.**

- දරුවන් කුඩා අවධියේ දී පියා පිළිබඳව අසන ප්‍රශ්නවලට නිසි පිළිතුරක් නොදුන්න ද යොවුන් වියට එළැඹෙන විට ඇය සත්‍ය ප්‍රකාශ කිරීමට තීරණය කරයි.

  "**සුප්පා දේවිය:** මා ප්‍රිය පුතණුවනි හා දුවණියනි, මා වෙත එනු මැන. ඔබ දෙදෙනාට කිව යුතු කිසිවක් තිබේ. (සිංහබාහු හා සිංහ සීවලී පැමිණෙති)"

- දරුවන්ට ආදරයෙන් විසිතුරු කතා කියා දෙමින් ඔවුන්ගේ අධ්‍යාත්මය පෝෂණයට කටයුතු කිරීම.

  "**සිංහබාහු:** ……………………
  ඔබ පාමුල හිඳුවා මා
  වැඩෙන වයසෙ දී
  රාජ කතා කී විසිතුරු
  දැන් සිහි වන්නේ
  …………………."

- නිරන්තරයෙන් සිය පියා පිළිබඳ දරුවන්ගේ සිත් තුළ උත්තරීතර හැඟීම් ඇති කරවන්නට කටයුතු කරයි. පියාගේ සිතෙහි දරුවන් පිළිබඳ ඇති සෙනෙහස (අප නැතිව පියා ඔබ, ළය පැලී මැරී යයි) ප්‍රබල ව අවධාරණය කරයි.

  "**සුප්පාදේවි:** මෙවන් බස් දොඩනු කිම
  ඔබ පියා හැර දමා
  යා හැකිද මේ ලෙනෙන්?

අප නැතිව පියා ඔබ
ළය පැලී මැරී යයි
පුරුදු වූ වන වාසෙ
මෙහි සැපත නොසැහෙ ද
ඔබ පියා සමගිනා
මෙතෙක් කල් වින්ද මා"

- පියාගේ අණට කීකරුව කටයුතු කිරීමේ වැදගත්කම මෙන්ම එසේ නොවුණහොත් ඇතිවන්නා වූ තත්ත්වය කාරුණිකව පහදා දෙයි.

**"සුප්පා දේවි:** නොකරන් එලෙස පියතුමගේ අණ
ඉක්මවලා පුතුනේ
නපුරුයි වන්නේ අප සැම දෙනටා
නොකළොත් කී ලෙසිනා

- සියලු යස ඉසුරු පසෙක ලා දිවිහිමියෙන් ආදරය කළ ප්‍රේමණීය ස්වාමියාව අතහැර ඒමට ඇය තීරණය කරන්නේ දරුවන්ගේ අභිවෘද්ධිය උදෙසා වේ.

**"සුප්පා දේවි:** ......................
දරුවන් දෙදෙනා
හට සෙත් ලැබෙනා
මඟ ඔස්සේ යා යුතු වන්නේ
නොසැලී කිසි මෙම වේලේ
දෙවියන් බාරයි මා සමිදා
මා වෙත නොවනු ය කෝපා
දරුවන් සන්දා
කරනෙමි මෙබන්දා
සිහි වේ හැම කල් හද සෝකෙන්
සමා වනු ඇති වරදා"

**"සුප්පා දේවී: වචනය**
නුඹගේ ද නුඹ නැඟණියගේ ද යහපත පිණිස මම නුඹ පියාණන් හැර පියා යන්ට සනිටුහන් කර ගතිමි. මා මෙසේ කරන්නේ හද තුල ඇති මහත් වේදනාවකිනි. දිවි හිමියෙන් මා ඒ වේදනාවෙන් පෙළෙන බව දනිමි. යමු දරුවෙනි."

## 2. භාෂා භාවිතයේ දී සරච්චන්ද්‍රයන් දක්වා ඇති දක්ෂතාව, දී ඇති නාට්‍ය කොටස ඇසුරෙන් විස්තර කරන්න.

- ශෛලිගත නාට්‍ය සම්ප්‍රදාය අනුව නිර්මාණය වන නාට්‍යවල භාෂාවට සුවිශේෂි ස්ථානයක් හිමි වේ.

- අනුප්‍රාසයට විශේෂ ස්ථානයක් ලබා දීම.

"තුමුල ගතින්දා
බාහු වෙළෙන්දා
වෙමි සේ තිදසින්දා
කුරිරු ගිජින්දා
කුඹු තල සීන්දා
ලමි සේ කෙසරින්දා
මාපිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ
තරකර ගලිනා ඇති දොර තදිනා

ඉවත දමා වෙරෙනා
මහා හෙණ හඬිනා පහරා සැණිනා
පෙරළෙමි බාහුවෙනා"

"වංග දේසේ වෙසෙන ජනතා
කෙරෙහි වේ මා යුතුකමා
කුමක්දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ"

"තරකර ගලිනා ඇති දොර තදිනා
ඉවත දමා වෙරෙනා
මහා හෙන හඬිනා පහරා සැණිනා
පෙරළෙමි බාහුවෙනා"

"පටහැනි වෙන්ටා නොව ඔහු අණටා
වෙන මග ගැළවෙන්ටා
නොපෙනෙන කලටා සැරසෙනු කුමටා
මා දැන් වළකන්ටා"

"නොදනිති හසරක් නුපුරුදු එ තිදෙන
පැමිණෙන පිරිපත වලකනු කෙලෙස ද
දිරි ඇති මුත් පුත නරයෙකි ගත මුදු
ලොව දැක නැත අද වන තුරු කිසි කල"

- ගීත බහුලව භාවිත කිරීම. එකී ගීත අන්තර්ගත පෝෂණයට ප්‍රබල මෙහෙයක් කරයි.

**"සුප්පාදේවි:** ප්‍රේමවන්ත දරුවෙනි මා හිදිනු කන්යොමා
කියමි පුවත සැක දුරරා
අසන නිතියෙනා
මැණිය නුඹ දෙදෙනගෙ වේ
කුමරියක් මනා
පසිඳු මහඟු වංග දේසෙ
නරවර හට දා"

**"සිංහයා:** ගල් ලෙන බිඳලා
ලෙන් දොර හැරලා
සිංහබා සිංහබා සිංහබා

මා සොදුර මා සොදුර මා සොදුර සිංහ සිංහ සීවලී මා ප්‍රිය දියණිය
ගල් ලෙන බිඳලා
ලෙන් දොර හැරලා
ගොසින් සැමදෙන
නැතේ කිසිවෙක්
මම දැන ගතිමි
මම සැක කලෙමි
සිංහබා සිංහබා සිංහබා

- සංවාදශීලී භාෂා භාවිතයත් දැකගත හැකිය.

**"සුප්පා දේවි:** ප්‍රේමවන්ත දරුවෙනි මා
හිදිනු කන් යොමා

කියමි පුවත සැක දුරුරා
අසන නිතියෙනා"

**"සිංහබාහු:** කිම්ද මැණියනි ඔබ මේ
පවසන වදනා
ඇස් කන් ඇදහිය නොහේ ය
ඇසෙන මෙ අරුමා
................................"

- උපමාලංකාර භාවිතය ද අන්තර්ගතය පෝෂණය කරයි.

"සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරු
මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් සපිරු
මනරම් යුග බා දී අහස ඔසවන යුරු
නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල් පුවරු"

"තුමුල ගතින්දා
බාහු බෙලෙන්දා
වෙමි සේ තිදසින්දා
කුරිරු ගිජින්දා
කුඹු තල සින්දා
ලමි සේ කෙසරින්දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ"

- ස්වභාවෝක්ති අලංකාරය භාවිතය

**"පොත් ඉන්නිසිය**

නෙක වර පුතු විසිනා අසන ලද පැන නිසා
සුප්පා දේවි මනා ඇති වී සිත වෙහෙසා
සිදු වූ පුවත අනාවරණය කරන ලෙසා
දෙදෙනා කැඳවාගෙන කීවා තතු මෙලෙසා"

**3. "සිංහබාහුගේ චරිතයෙන් තරුණයෙකුගේ අදහස් ක්‍රියාකාරීත්වය මනාව පිළිබිඹු වේ." පාඩම ඇසුරින් පැහැදිලි කරන්න.**

- ප්‍රඥාවන්ත බව හා විමසුම් සහගත බව කැපී පෙනේ.

**"සිංහ බාහු:** ..........................
අප නරයන් වග පැවසූ ඒ අරුමය
නැත මට වැටහෙන්නේ
අරණේ අප හට බිය පැමිණෙන්නට
කාරණ එළි වන්නේ
පියතුමගේ ගත නැඹුරු කළ සිත
කුහුලින් ඉතිරෙන්නේ"

**"සුප්පාදේවි:** සහවන්නට තතු බැරිය පුතු ගෙන්
මිගිදා නිතින සොඳිනා පෙනෙන විලසා
අදහන්නේ නැත කීවද මුසා
නැණ මුකුරා ගොස් ඇත පුරා වයසා"

- තරුණ ජවය ඔද වැඩුණු චරිතයකි.

**"සිංහබාහු:** තුමුල ගතින්දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තිද සින්දා

කුරිරු ගිජින්දා
කුඹු තල සින්දා

ලමි සේ කෙසරින්දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ"

- රැඩිකල් අදහස් දරන නිභය තීරණ ගන්නා චරිතයකි.

**"සිංහබාහු:** මැනියනි කීව ඔබ බස් අසා
සනිටුහන් කර ගතිමි
නොපමාව යා යුතුය
මේ ලෙනෙන් ඔබ දෙදෙන
මා සමග යා යුතුය
වන වාසෙ හැරදමා
නර වාසෙ සොයමිනා
අප දෙදෙන හට උරුම
ජීවිතය මේ නොවේ"

- අනාගත යුතුකම් වගකීම් පිළිබඳ සිතෙන හැඟීම්වලට නොව බුද්ධියට ඉඩදී කටයුතු කරන චරිතයකි.

**"සිංහබාහු:** ............................
යන්ට දැන්නම් කාලෙ වේ
මෑණියන් හා නැගණි සමගින්
උරුමෙ අපගේ සොයමිනා
වංග දේසේ වෙසෙන ජනතා
කෙරෙහි වේ මා යුතුකමා
කුමක් දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ"

- ස්වාධීනත්වය අගයන අයිතිවාසිකම් දිනා ගනු පිණිස සටන් වදින චරිතයකි.

**"සිංහබාහු:** .........................
කුමරියක් වේ මාගේ මව්
උත්තරීතර ජන්ම ලද්දී
උරුම වූ යස ඉසුරටටා
මට ද හිමිවේ වංග රාජ්‍යය
ප්‍රබල නරවර පරපුරෙන්
කුමක්දෝ මේ පාපේ ලෙනේ මේ විසීමේ සෙතක් දෝ"

**4. "නාට්‍යයක් සාර්ථක වීමට නම් නාට්‍යමය අවස්ථා අවශ්‍ය වේ." සිංහබාහු නාට්‍යයේ 'ලෙන අතහැර යාම' යන අංගය ඇසුරින් විමසීමක් කරන්න.**

- වයස මුහුකුරා යත්ම දරුවන් තුළ පියාගේ ස්වරූපය පිළිබඳ කුහුලක් ඇතිවීම.

**සිංහ බාහු:** ...............................
අරණේ අප හට බිය පැමිණෙන්නට

කාරණ එළි වන්නේ
පියතුමගේ ගත නැරඹූ කල සිත
කුහුලෙන් ඉතිරෙන්නේ
නැත සම වන්නේ වෙනස පෙනෙන්නේ
විලස පියාණන්නේ
කෙලෙස ද ඔහු හට අප දා වූයේ
ඇයි මව නොකියන්නේ"

- පියා පිළිබඳ රහස් එළි කිරීමට යාමේදී සුප්පා දේවිය ගේ සිත්හි අනාගත ඉරණම පිළිබඳව නැගෙන සිතිවිලි

**"සුප්පා දේවී:** සඟවන්නට තතු බැරි ය පුතුගෙන්
මිහිදා නිතින සොඳිනා පෙනෙන විලසා
අදහන්නේ නැත කීව ද මුසා
නැණ මුකුරා ගොස් ඇත පුරා වයසා

පවසන්නට තතු හද සංසලා
නැතිවේද සෙනේ හැර යා ද ලෙන නොදැනා
වළකන්නට බැරි දේට පිහිටා
වනු දෙවියනේ මා අසරණේ නොහැරා"

- පියා පිළිබඳ තතු දැනගත් පසු සිංහබාහු කුමාරයා ගන්නා ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රේක්ෂක සිත්හි අවිනිශ්චිත බවක් ඇතිවීම.

**"සිංහ බාහු:** මෑනියනි කීවා ඔබ බස් අසා
සනිටුහන් කර ගතිමි
නොපමාව යා යුතු ය
මේ ලෙනෙන් ඔබ දෙදෙන
මා සමග යා යුතුය
වන වාසෙ හැර දමා
නර වාසෙ සොයමිනා
අප දෙදෙන හට උරුම
ජීවිතය මෙය නොවේ"

- සිංහබාහු ලෙන අතහැර යාමට ගත් තීරණයට සුප්පා දේවිය හා සිංහ සීවලී දක්වන ප්‍රතිචාරයෙන් සිංහබාහුගේ තීරණය ක්‍රියාත්මක කිරීමට හැකිවේ ද යන සැකය ප්‍රේක්ෂක සිත්හි ඇති වේ.

**සුප්පාදේවි:** මෙවන් බස් දොඩනු කිම
ඔබ පියා හැර දමා
යා හැකිද මේ ලෙනෙන්
අප නැතිව පියා ඔබ
ළය පැලී මැරී යයි
පුරුදු වූ වන වාසෙ
මෙහි සැපත නොසැහේ ද
ඔබ පියා සමඟිනා
මෙතෙක් කල් වින්ද මා

**සිංහ සීවලී:** මා පියා හැර දමා
යන්නෙ අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී

පැමිණි විට නැති කෙනෙක්
ආහර පිස දෙන්නටා
හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙසදෝ
නැද්ද වෙත පියාණන්
ආදරේ ඔබ හදේ
මෙවන් දේ කියන්ටා
සොහොයුරනි පෙම්බරා"

- සිංහබාහු ගල පෙරළා දැමීම.

**"පොතේ ඉන්නිසය**

| | |
|---|---|
| සේ රිවි බිම්බා පතළ තෙද බලැති | මහරු |
| මෙන රන් ටැම්බා නිසසල ගුණයෙන් | සපිරු |
| මනරම් යුග බා දී අහස ඔසවන | යුරු |
| නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල් | පුවරු" |

- ලෙන්දොර හැරීමෙන් පසුව සුප්පා දේවිය අනාගතයේ සිදුවන්නට යන මහා විපතක් පිළිබඳව සඳහන් කිරීම.

**"සුප්පාදේවි:** වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
මුව පත්වූයේ
නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම් දෝ
මුලාවී මඟ නො පෙනේ"

- සිංහබාහු, සුප්පා දේවිය හා සිංහසීවලී ලෙන අත හැර යාමෙන් පසු සිංහයා පැමිණේ. වියෝගයෙන් වියරු වැටෙන සිංහයා අඹු දරුවන් සොයා යාමට තීරණය කරයි. අඹු දරුවන් සොයා යන සිංහයාගේ ක්‍රියාකලාපයන් පිළිබඳව ප්‍රේක්ෂක සිතේ දැඩි කුතුහලයක් ඇති වේ.

**"සිංහයා:** ගොස් සෙදින මම සොය නෙමි වනපෙත
සියලුම ගම රට නර කැල හැසිරෙන"

**5. "සුප්පා දේවිය ස්වාමියා වෙනුවෙන් කැපවුණු ආදර්ශවත් භාර්යාවකි." සිංහබාහු නාටකයේ ඔබට අදාළ කොටස ඇසුරෙන් මේ පිළිබඳ විමසන්න.**

- යස ඉසුරු හැර දමා ස්වාමියා සමඟ ප්‍රේමයෙන් බැඳී ජීවත් වීම.

**සුප්පා දේවි:** සිනිඳු වස්ත්‍ර මිනි අබරණ තුමුල මාලිගා
සුවඳ බොජුන් සැප සයනා
මිරිවැඩි සහලා
මේ සියල්ල හැරදා මම
ආවෙමි වලටා
වෙසෙන ලෙසා ඔබ පිය මා
සමිඳුන් සමගා"

- සිය ස්වාමියා කෙරෙහි පවත්නා භක්ත්‍යාදරය දරුවන් ඉදිරියේ මහත් අභිරුචියෙන් ප්‍රකාශ කිරීම.

**"සුප්පාදේවි:** අසිරිමත් වූ දේකි මෙලොව
ප්‍රේමය නමිනා
වැනූ පොරණ කිවිඳුන් සොඳ

රස මුසු බසිනා
සියලු භෝග වස්තු ඉසුරු
හරිති නෙක් දනෝ

සව් සැප දෙන සිතුමිණ වන්
ප්‍රේමය සන්දා"

**"සුප්පාදේවි:** ඔබ පියාණෝ නරයෙකු නො ව වනයෙහි දී මට හමු වූ සිංහ රාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රාජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි, දරුවෙනි."

- ස්වාමියා හැර නොයන ලෙසත් පුතුට අවවාද කිරීම, ඔහුගේ ගුණ දරුවන්ට වටහා දීම.

**"සුප්පා දේවි:** මෙවන් බස් දොඩනු කිම
ඔබ පියා හැර දමා
යා හැකිද මේ ලෙනෙන්
අප නැතිව පියා ඔබ
ළය පැලී මැරී යයි"

- දරුවන්ගේ අනාගත අභිවෘද්ධිය තකා ස්වාමියා හැර යාමට තීරණය කළ ද ඒ පිළිබඳ අතිශයින් දුකට පත් වීම සහ සමාව අයද සිටීම.

**"සුප්පාදේවි:** යන්නට වේ දැන් සැමියා හැරා
වන වාසයෙන් මේ පුතු සමගා
දරුවන් දෙදෙනා
හට සෙත් ලැබෙනා
මඟ ඔස්සේ යා යුතු වන්නේ
නොසැලී කිසි මෙම වේලේ
දෙවියන් බාරයි මා සමිදා
මා වෙත නොවනු ය කෝපා
දරුවන් සන්දා
කරනෙමි මෙබන්දා
සිහි වේ හැම කල් හද සෝකෙන්
සමා වනු ඇත වරදා"

- භාර්යාවක ලෙස ස්වාමියා සමග තමන් ගෙවූ ජීවිතය පිළිබඳ අතිශයින් තෘප්තිමත් වීම.

**"සුප්පා දේවි:** ..............................
පුරුදු වූ වන වාසෙ
මෙහි සැපත නොසැහෙ ද
ඔබ පියා සමගිනා
මෙතෙක් කල් වින්ද මා

**6. "සම්ප්‍රදානුකූල පවුලක ගැහැණු දරුවකුගේ ආකල්පය සිංහසීවලී ගේ චරිතය නිරූපණය වේ." විමසන්න.**

- දැඩි පිය සෙනෙහසින් යුක්තවීම.

**සිංහ සීවලී:** මා පියා හැර දමා
යන්න අප කෙලෙස දෝ
වලට ගොස් විඩා වී
පැමිණි විට නැත කෙනෙක්
අහර පිස දෙන්නටා

හුදෙකලා මේ ලෙනේ
ඉන්නෙ ඔහු කෙලෙසදෝ
නැද්ද වෙත පියාණන්
ආදරේ ඔබ හදේ
මෙවන් දේ කියන්ටා
සොහොයුරනි පෙම්බරා"

**"සිංහයා:** සුරතල් දියණිය
මොලකැටි වදනින්
මා සනසන්නිය
අහර පිසන්නිය
කවන්නිය, පොවන්නිය

මා ගැන බිය වන්නිය
වනයේ දුකක් වි ද
අසන්නිය සොයන්නිය"

- මව පිළිබඳව දැඩි සෙනෙහසකින් යුතු වීම.

**"සිංහ සීවලී:** ..............................
පින් පිඩ වැනි මා මැණිය
කියනු නොවළහා
ඇයි ද වල්කලා පොරවා
ලෙන තුළ ඉන්නේ"

- මවගෙන් ඇසූ කතා ඇසුරින් ස්ත්‍රීත්වයටඅනුරූප දේවල් ඇගේ ප්‍රාර්ථනා ලෝකයේ සැරිසැරීම.

"සිංහ සීවලී: ..............................
රාජ කුමාරයෝ පලඳිති
රන් මිණි බරණා
සිනිඳු වස්ත්‍ර හැඳ ලා රන්
මිරිවැඩි සහළා

- ලෙන් දොර විවෘත කිරීම පියාට හැර කිසිවෙකුට කල නොහැකි බව පවසා සොහොයුරා වැළැක්වීමට උත්සාහ දැරීම.

**"සිංහ සීවලී:** කෙසේ හෝ යා නොහැක
ඇතේ තර කර වසා
දොර ලෙනේ මහ ගලින
පියතුමගෙ රුදු තුමුල
බාහු යුවළින් ම මිස
බැරිය සොලවන්ට එය
යන්න නො සිතන්න මා
සොහොයුරනි පෙම්බරා"

**7. අවස්ථා නිරූපණයේ ප්‍රබල බව සිංහබාහු නාටකය සාර්ථක වීමට බලපා තිබේ." විමසන්න.**

- සිංහබාහුගේ සිතට කුහුලක් වූ සිංහයා පිළිබඳ රහස හෙළිදරව් කරන අවස්ථාව.

**"සුප්පාදේවි:** ප්‍රේමවන්ත දරුවෙනි මා
හිදිනු කන් යොමා

කියමි පුවත සැක දුරැරා
අසන නිතියෙනා
මැණියන් නුඹ දෙදෙනගෙ වේ
කුමරියක් මනා
පසිඳු මහඟු වංග දේසේ
නරවර හට දා"

- සිංහ බාහුගේ ශක්තිය පිළිබඳ අචල විශ්වාසයෙන් ගල් දොර බිඳ දැමීමට තීරණය කරන අවස්ථාව.

**"සිංහබාහු:** තුමුල ගතින්දා
බාහු බෙලෙන් දා
වෙමි සේ තෙදසින් දා
කුරිරු ගිජින්දා
කුඹු තළ සින්දා
ලමි සේ කෙසරින්දා
මා පිය මිගිදා කරනා විකුමන්
ඇයි මට බැරි වන්නේ
තර කර ගලිනා ඇති දොර තදිනා
ඉවත දමා වෙරෙනා
මහ හෙණ හඩිනා පහරා සැණිනා
පෙරළෙමි බාහුවෙනා"

- සිංහබාහු ගල් පුවරුව පෙරළා ලෙන් දොර හරින අවස්ථාව.

**"පොතේ ඉන්නිසය**

සේ රිවි බිම්බා පතළ තෙද බලැති	මහරු
මෙන රන් ටැමබා නිසසල ගුණයෙන්	සපිරු
මනරම් යුග බා දී අහස ඔසවන	යුරු
නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල්	පුවරු"

- සිංහබාහු ගල් දොර හැරීමෙන් පසු සුප්පාදේවිය මහත් කම්පනයට හා ශෝකයට පත්වෙයි. අනතුරුව ඇය දරුවන්ගේ යහපත උදෙසා සැමියා හැර දැමීමට තීරණය කරන අවස්ථාව.

**"සුප්පාදේවි:** වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ
මුව පත් වූයේ
නියත විනාසේ
මේ මොහොතේ කිම් කරනෙම් දෝ
මුලාවී මග නොපෙනේ
යන්නට වේ දැන් සැමියා හැරා
වන වාසෙන් මේ පුතු සමගා
දරුවන් දෙදෙන
හට සෙත් ලැබෙනා
මග ඔස්සේ යා යුතු වන්නේ
නොසැලී කිසි මෙම වේලේ

- සිංහබාහු, සුප්පා දේවිය හා සිංහ සීවලී ලෙන අතහැර යාමෙන් පසු සිංහයා පැමිණේ. වියෝගයෙන් වියරු වැටෙන සිංහයා අඹු දරුවන් සොයා යාමට තීරණය කරන අවස්ථාව,

**"සිංහයා:** ගොස් සෙදින මම සොයනෙමි වනපෙත
සියලුම ගම රට නර කැළ හැසිරෙන"